Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 43 S I

නම: ........................................ | චිත්‍ර කලාව | කාලය පැය එකයි

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



01. පූජනීය ස්ථානයකට පිවිසෙන පඩිපෙළ පාමුල පිහිටි අර්ධ කවාකාර කැටයම් පුවරුව ................................... නමින් හැඳින්වේ.

02. ආරම්භයේ දී ...................................... පුවරුවක් වූ මෙය අනුරාධපුර, පොළොන්නරු යුගවල දී අර්ධ කවාකාර හැඩය දක්වා වර්ධනය විය.

03. මෙය මහනුවර යුගයේ දී ...................................... හැඩයක් දක්වා වෙනස් විය.

04. මෙහි දැක්වෙන අඩ නෙළුමෙන් ...................................................... නම් අර්ථය සංකේතවත් වේ.

05. ඉහත ඡායාරූපයේ දැක්වෙන කලා කෘතිය අනුරාධපුරයේ .................................................. ඉදිරිපිට දක්නට ඇත.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

06. වෙස් මුහුණු කර්මාන්තයේ දී ලී කොටයේ ඇති ගැට සහිත තැන් කපා පැතලි හැඩයක් සකස් කර ගැනීම හඳුන්වන නම කුමක් ද? ..................................................................

07. හින්දු ඉතිහාසයේ, සංගකාලම් (සංග යුගයේ) සිට දැව කැටයම් තිබූ බවට තොරතුරු හෙළිදරව් කරන ඉන්දීය ඉතිහාස ග්‍රන්ථය කුමක් ද? ..........................................................

08. මහනුවර යුගයේදී ලාක්ෂා කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් හැඳින්වූ නම කුමක්ද ? ..................................................

09. නාට්‍ය වර්ග දෙකකි. එක් වර්ගයක් ලෝක ධර්මී යනුවෙන් හඳුන්වයි. අනෙක් වර්ගය හඳුන්වන නම කුමක් ද?
...............................................

10. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ බෝ කොළ සතරෙන් නිරූපණය කරන්නේ කුමක් ද?
..............................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් <u>නිවැරදි පිළිතුර</u> තෝරා <u>යටින් ඉරක්</u> අඳින්න.**

11. ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව ලෙස හඳුන්වන්නේ,
 1. නල දමයන්ති ය. 2. ඉන්දු ය. 3. නීලා ය. 4. ඇරකෝමා ය.


12. අනුරාධපුර යුගයේ හමුවන කලාත්මක බවින් උසස්ම වාහල්කඩ නිර්මාණය කුමක් ද?
 1. රුවන්වැලිසෑ වාහල්කඩ 2. අභයගිරි වාහල්කඩ
 3. මිහින්තලේ කණ්ඨක චේති වාහල්කඩ 4. ජේතවන විහාර වාහල්කඩ

13. වෘෂභ කුඤ්ඤරය නම් සැරසිල්ල සඳහා භාවිතා කළ සත්ව රූප වන්නේ,
   1. ගවයා සහ ඇතා ය. 2. ගවයා සහ සිංහයා ය. 3. ගවයා සහ මකරා ය. 4. ඇතා සහ සිංහයා ය.

14. "ඉන්දු" චිත්‍ර කතාවෙන් ජනප්‍රියත්වයට පත් වූ චිත්‍ර කතා ශිල්පියා වන්නේ,
   1. බන්දුල හරිස්චන්ද්‍ර ය. 2. දයා රාජපක්ෂ ය. 3. ජනක රත්නායක ය. 4. ජී.එස්. ප්‍රනාන්දු ය.

15. සෙංකෝලය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන ශිල්පියා වන්නේ,
   1. A.C.G.S. අමරසේකර ය. 2. ස්ටපතිරායර් ය. 3. M. සාර්ලිස් ය. 4. S.P. චාල්ස් ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති රූපයට වඩාත් ගැළපෙන රූපය ඉදිරියේ ඇති A,B,C,D,E අක්ෂරයට අයත් රූප සටහන් ඇසුරින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ දක්වන්න.**

16.  (   )

A 

17.  (   )


B 

18.  (   )

C 

19.  (   )

D 

20.  (   )

E 

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශනයන් නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

21. **වෙස්මුහුණු කර්මාන්තයේ දී වෙස් මුහුණ පාට කිරීමට ප්‍රථම සුදු පැහැති මූලික ආලේපනයක් තවරා ගනු ලැබේ.** (   )

22. **වඩම් නම් කඹ යොදා ඇදගෙන යන වාහනයක් ලෙස මයිල් (මොණර) වාහනම් හඳුන්වා දිය හැකිය.** (   )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

23. ලාක්ෂා කර්මාන්තයේ දී ශිල්පීන්, ක්‍රම දෙකකට ලාක්ෂා නිර්මාණ සිදුකරන අතර, ඒවා තලන වැඩ හා වාත්තු වැඩ ලෙස හැඳින්විය හැකිය. (    )

24. සෙංකෝලයෙන් සමස්ත, මන්ත්‍රී මණ්ඩලයේ බලතල පිළිබඳව සංකේතවත් කරයි. (    )

25. කාන්තාවන් පස් දෙනෙකුගෙන් සමන්විත කලයක හැඩය ගත් නිර්මාණය පංචනාරී ඝටය ලෙස හැඳින්වේ. (    )

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර F,G, H,I, J යන රූප සටහන් ඇසුරින් තෝරා අදාළ හිස්තැනෙහි ලියන්න.**

F 

G 

H 

I 

J 

26. F අක්ෂරයෙන් දැක්වෙන්නේ, ........................................................ නම් ශාන්තිකර්මයයි.

27. G අක්ෂරයෙන් දැක්වෙන්නේ, ................................................ හි දක්නට ලැබෙන කලාත්මක බවින් උසස් සඳකඩ පහනයි.

28. H අක්ෂරයෙන් දැක්වෙන ............................................. රුව යෙදීම මගින්, හින්දු කෝවිලක ආරක්ෂාව සංකේතවත් වේ.

29. I අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමයේ දෑත් තුළින් .......................... මුද්‍රාව නිරූපණය වේ.

30. J අක්ෂරයෙන් දැක්වෙන්නේ යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා අතරින්, ..................................... ගුහාවේ හමුවන සිතුවමකි.

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචන පැහැදිලි වන සේ වාක්‍යය බැගින් තනන්න.**

31. කිරි හිඳවීම :- ..................................................................................................................................

32. පර්යාවලෝකනය :- ..................................................................................................................................

33. කොට්ටල් බද්ද :- ..................................................................................................................................

34. වඩම් :- ..................................................................................................................................

35. එස්.පී. චාල්ස් :- ..................................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

• ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති ඡායාරූපය ඇසුරෙන්, පහත උපශීර්ෂ යටතේ පිළිතුරු සපයන්න.



36. කලා කර්මාන්තය :- ..........................................................................................

37. හඳුනාගත් බව :- ..........................................................................................

38. ප්‍රචලිත ප්‍රදේශ :- ..........................................................................................

39. අමු ද්‍රව්‍ය :- ..........................................................................................

40. භාවිත අවස්ථා :- ..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 43 | S | II,III

නම: .............................................. **චිත්‍ර කලාව** කාලය පැය දෙකයි

**II කොටස - ද්‍රව්‍ය බලා ඇඳීම** කාලය පැය 1/2

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් පමණක් චිත්‍රණය කරන්න.
- ද්‍රව්‍ය වල ස්වභාවය, එළිය අඳුර හා පර්යාවලෝකන ලක්ෂණ පෙනෙන පරිදි තලයට ගැලපෙන සේ සම්පිණ්ඩනය කර අඳින්න. (ලකුණු 20)

**III කොටස** කාලය පැය 1.1/2

- පහත සඳහන් ප්‍රකාශන/මෝස්තර/ග්‍රැෆික් මාතෘකා අතුරින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

**ප්‍රකාශන**

01. ආගමික ස්ථානයක පුද පූජාවක් සඳහා සහභාගී වන පිරිසක්
02. පාසලේ ක්‍රීඩා උළෙලක අවස්ථාවක්
03. බස් නැවතුමක සිදුවීමක්
04. වන රොදක නිදහසේ සැරසරන වන සතුන්

**මෝස්තර**

01. ළමා ඇඳ ඇතිරිල්ලක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
02. සත්ව හැඩැති රූප භාවිතයෙන් කුඩ රෙද්දක් සඳහා සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
03. සමචතුරස්‍රාකාර හැඩයේ කුෂන් කවරයක් සඳහා සම්ප්‍රදායික සැරසිලි භාවිතා කර මෝස්තරයක් නිර්මාණය කරන්න.

**ග්‍රැෆික්**

01. අලුතෙන් හඳුන්වා දෙන පළතුරු බීම බෝතලයක් සඳහා නිර්මාණාත්මක ලේබලයක් නිර්මාණය කරන්න.
02. ළමා කතන්දර පොතකට පිට කවරයක් නිර්මාණය කර, ඔබ කැමති නමක් යොදන්න.
03. "ඩෙංගු උවදුර වළකමු" යන මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## චිත්‍ර කලාව 9 - පිළිතුරු පත්‍රය

1 - සඳකඩ පහන
2 - හතරැස් ගල් පුවරුවක් / ආසන චතුරස්‍රාකාර
3 - ත්‍රිකෝණාකාර
4 - තිවංක
5 - බිසෝමාලිය (මහසෙන් මාලිගය)
6 - පායම් පැහීම
7 - මනිමේඛලෙයි
8 - හංගිඩියන්
9 - නාට්‍ය ධර්මී
10 - සතර බ්‍රහ්ම විහරණ (මෛත්‍රී, කරුණා, මුදිතා , උපේක්ඛා)
11 - නීලා
12 - මිහින්තලේ කණ්ඨක චේතියවාහල්කඩ
13 - ගවයා සහ ඇතා
14 - දයා රාජපක්ෂ
15 - S.P. චාල්ස්

| | | | | |
|---|---|---|---|---|
| 16 - (B) | 17 - (D) | 18 - (A) | 19 - (E) | 20 (C) |
| 21 (✓) | 22 - (×) | 23 - (×) | 24 - (✓) | 25 - (✓) |

26 - කොහොඹා කංකාරිය
27 - දළදා මාළිගයේ
28 - යාලි
29 - පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව
30 - ලැස්කෝ
31 - කිරි හිඳවීම :- ලීයේ ඇති අධික කිරිගතිය ඉවත්කොට කදුරු ලීය පදම් කරගැනීම සඳහා දුමේ දමා හෝ මඩ අවුවේ දමා වේලා ගැනීම.
32 - පර්යාවලෝකනය :- ළඟ ඇති වස්තු විශාලවත් දුර ඇති වස්තු කුඩාවටත් පෙනෙන සේ දැක්වීම.
33 - කොට්ටල් බද්ද - මහනුවර යුගයේ දී ලාක්ෂා ශිල්පීන් සේවය කළ රාජකීය කාර්මික අංශය කොට්ටල් බද්ද ලෙස හඳුන්වයි.
34 - වඩම් - කඹ යොදා ඇදගෙන යන හින්දු වාහන වර්ගයකි.
35 - S.P. චාල්ස් - ජාතික කොඩිය, සෙංකෝලය නිර්මාණ ශිල්පියා වේ.
36 - වෙස් මුහුණු කර්මාන්තය
37 - නාග රාක්ෂ
38 - බෙන්තර, මිරිස්ස, රයිගම් කෝරලය මතුගම (දකුණු පලාතේ අම්බලන්ගොඩ ප්‍රදේශය)
39 - දිය කදුරු , රුක් අත්තන
40 - සම්ප්‍රදායික ශාන්තිකර්ම හා ජන නාට්‍ය උදෙසා වෙස් මුහුණු වර්ග භාවිතා කරයි.

## II පත්‍රය

- පෙට්ටියක් (උස 10cm , පළල 20 cm , දිග 28 cm)
- ගස්ලබු ගෙඩියක්
- ඇන්තූරියම් මල් සහිත පෝච්චියක්

